www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# එල්ටීටීඊය සමග සාකච්ඡාවලට බැසීමේ තැත ශ්‍රී ලංකාවේ ආන්ඩුව තුල ආතතීන් තියුනු කරයි

## Sharpening tensions in Sri Lankan government over talks with LTTE

**කේ රත්නායක විසිනි**
**2005 මාර්තු 05**

සාම සාකච්ඡා නැවත ඇරඹීමටත් සුනාමි සහන කටයුතු සඳහා දෙමල ඊලම් විමුක්ති කොටි සංවිධානය (එල්ටීටීඊ) සමග ඒකාබද්ධ මන්ඩලයක් පිහිටුවීමටත් ශ්‍රී ලංකාවේ ජනාධිපතිනි චන්ද්‍රිකා කුමාරතුංග දරන උත්සාහය පාලක සභාගය තුල දැනටමත් තියුනු වී ඇති ආතතීන් තවත් ගැඹුරු කර ඇත. එවැනි මන්ඩලයක් පිහිටුවන්නේ නම් හෝ උතුරු නැගෙනහිර සඳහා අන්තර්වාර පාලනයක් පිහිටුවීම ගැන එල්ටීටීඊය සමග සාකච්ඡා අරඹන්නේ නම් ආන්ඩුවෙන් දොට්ට බසින බවට පාලක එක්සත් ජනතා නිදහස් සන්ධානයේ (එජනිස) දෙවන ප්‍රධාන පාර්ශ්වකරු වන ජනතා විමුක්කි පෙරමුන (ජවිපෙ) කුමාරතුංගට අනතුරු අඟවා ඇත.

ගිය අවුරුද්දේ අප්‍රේල් මාසයේ එජනිසය බලයට පත්වූ තැන් පටන් ම, එල්ටීටීඊය සමග සාම සාකච්ඡා යලි පටන් ගන්නේ නම් ආන්ඩුවෙන් දොට්ට බසින බවට ජවිපෙ නැවත නැවතත් තර්ජනය කලේ ය. දෙමල විරෝධී ස්වෝත්තමවාදය ඇවිස්සීමේ ආන්තික වැඩවලට බැසගෙන සිටින ජවිපෙ එල්ටීටීඊයට කිසි ම සීමිත සහනයක් දීමට පවා සතුරුව සිටියි. සුනාමි ව්‍යසනයෙන් පසුව, එල්ටීටීඊය විසින් පාලිත ප්‍රදේශවලට සෘජුව කිසිම ආධාරයක් සැපයීමට හෝ ජාත්‍යන්තර නිලධාරීන් එම පෙදෙස්වලට සංචාරය කිරීමට හෝ ජවිපෙ විරුද්ධ වූයේ එය එල්ටීටීඊය පිලිගැනීමකට සමාන වන්නේ යයි ප්‍රකාශ කරමිනි.

දෙසැම්බර් 26 දා සුනාමියෙන් ශ්‍රී ලංකාවේ 30,000කට අධික ජනකායක් මරනයට පත් කෙරුනු අතර තවත් දශ ලක්ෂ භාගයක් අවතැන් කෙරුනි. හතරෙන් තුන් පංගුවක් පමන විනාශයට ලක් වූයේ දශක දෙකක සිවිල් යුද්ධයෙන් එවන විටත් ව්‍යසනයට පත්ව තිබූ උතුරු නැගෙනහිරයි. දරුනු ම බලපෑමට ලක් වූ ඇතැම් පෙදෙස් එල්ටීටීඊ පාලනය යටතේ පවතී. එම පෙදෙස්වලට දෙමල පුනරුත්ථාපන සංවිධානය (ටීආර්ඕ) හරහා ජාත්‍යන්තර ආධාර ලබා දිය යුතු බව එල්ටීටීඊය අවධාරනය කලේ ය.

ටීආර්ඕවට ආධාර දීමට ජවිපෙ මෙන් ම කුමාරතුංගත් විරුද්ධව සිටි නමුත් ඇයට අනෙක් පැත්ත බලන්ට සිදු විය. එක්සත් ජනපද, ජපාන හා යුරෝපීය මහ බලවතුන් එල්ටීටීඊයට කෙලින් ම ආධාර ලබා නො දුන්නත් එල්ටීටීඊය විසින් පාලිත පෙදෙස්වලට සහන සැපයීම සඳහා එම සංවිධානය සමග ආන්ඩුව ''ඒකාබද්ධ යාන්ත්‍රනයක්'' තහවුරු කල යුතු ය යි අවධාරනය කලේ ය. මෙම පියවර වනාහි 2003 දී බිඳ වැටුනු සාම සාකච්ඡා යලි ඇරඹීමට සුනාමි අර්බුදය යොදා ගැනීමේ පලල් සැලසුමක කොටසකි.

කඳු ගැසෙන මුදල් අර්බුදයකට මුහුන පා සිටින කුමාරතුංගට ඊට එකඟ වෙනවා හැර වෙනත් විකල්පයක් නො වීය. 2003 දී ටෝකියෝවේ පැවති ආධාර දෙන කන්ඩායමේ දී පොරොන්දු වූ ඩොලර් බිලියන 4.5ක ආධාර ඊනියා සාම ක්‍රියාවලියට ගැට ගසා තිබූ හෙයින් ඒවා ලබා ගැනීමට ඇගේ ආන්ඩුවට නොහැකි විය. තවත් ඩොලර් බිලියන 1.8ක මුදලක් සුනාමි ප්‍රතිසංස්කරන ආධාර ලෙස දීමට ප්‍රතිඥා ලැබී ඇති නමුත් ''ඒකාබද්ධ යාන්ත්‍රනයක්'' නොමැතිව එම මුදලින් වැඩි කොටසක් නොලැබී යනු ඇත.

ව්‍යාපාරික සම්මේලනයක් අමතා භාන්ඩාගාර ලේකම් පී. බී. ජයසුන්දර ගිය සතියේ ප්‍රකාශ කලේ පොරොන්දු වූ සුනාමි ආධාරවලින් මෙතෙක් ලැබී ඇත්තේ සියයට 4ක් හෙවත් ඩොලර් මිලියන 75ක් පමනක් බවයි. විනාශයට පෙරාතුවත් එජනිස ආන්ඩුව මැතිවරන පොරොන්දු ඉටු කිරීමට අසමත්වීම නිසා වැඩෙන විරුද්ධත්වයකට මුහුන පා සිටියේ ය. දැන් ආන්ඩුව මුහුන දී සිටින්නේ සුනාමියට ගොදුරුව සහන හා ඉදි කිරීමේ ආධාර නො ලැබ ලක්ෂ සංඛ්‍යාත ජනකායක් තුල කැකෑරෙන නො සන්සුන්තාවකට යි.

වෙඩි නැවැත්වීමේ ගිවිසුමෙහි තෙවන වසර සටහන් කරමින් පෙබරවාරි 22දා නිකුත් කල නිවේදනයකින් ආන්ඩුව ප්‍රකාශ කර සිටියේ එල්ටීටීඊය සමග සාම සාකච්ඡා ඇරඹීමට කටයුතු කරමින් සිටින බව යි. ''මහ ජනතාවගේ මානුෂික අවශ්‍යතා ඉටුකිරීමට අන්තර්වාර අධිකාරියක් පිහිටුවීම ගැන ආන්ඩුව එල්ටීටීඊය සමග'' සාකච්ඡා කරමින් සිටින බව ද ''ඉන් අනතුරුව ජනවාර්ගික ගැටුමට අවසන් විසඳුමක් සඳහා සාකච්ඡාවලට එලඹෙන'' බව ද එම ප්‍රකාශය වාර්තා කලේ ය. සැලකිල්ලෙන් වචන භාවිතා කල මෙම ප්‍රකාශයෙන් සාකච්ඡා යලි ඇරඹීමේ පදනම ලෙස අන්තර්වාර පරිපාලනයක් පිහිටුවන ලෙසට එල්ටීටීඊය

කරන ඉල්ලීමට සහනයක් දී තිබුනි. ජවිපෙ වහාම මෙම ප්‍රකාශය හෙලා දුටුවේ ය. පෙබරවාරි 24 දා පාර්ලිමේන්තුවට ප්‍රකාශයක් කල ජවිපෙ පර්ලිමේන්තු කන්ඩායම් නායක විමල් වීරවංශ ආන්ඩුව එවන් පියවරක් ගත හොත් ජවිපෙ ''ආන්ඩුවේ කොටස්කරුවෙකු වීම අවසන් කරන'' බව කියා සිටියේ ය. එල්ටීටීඊය සමග ඒකාබද්ධ මන්ඩලයක් පිහිටුවීම එම සංවිධානයට ''රාජ්‍යතාන්ත්‍රික භාවයක්'' ලබා දීමට සමාන බව ද ඔහු ප්‍රකාශ කලේ ය.

"සුනාමි ආධාර බෙදීම සඳහා එල්ටීටීඊය සමග ඒකාබද්ධ යාන්ත්‍රනයකට හෝ අන්තර් වාර ස්වයං-පාලනයකට හෝ ගිය හොත්" සිය පක්ෂය "ආන්ඩුවෙන් කැඩෙන" බව මාර්තු 2 දා *රොයිටර්* ප්‍රවෘත්ති සේවයට අදහස් දක්වමින්, ජවිපෙ නායක සෝමවංශ අමරසිංහ යලිත් අවධාරනය කලේ ය.

ආන්ඩුවෙන් ඉවත් වන බවට ජවිපෙ මීට පෙරත් තර්ජනය කර ඇති නමුදු, මෙම මෑතම අනතුරු ඇඟවීම් වියරු සහගත ය. "වාමාංශික" පක්ෂයක් ලෙස හා "සමාජවාදී" පක්ෂයක් ලෙස පවා පෙනී සිටීමට බොහෝ විට පාහේ උත්සාහ කර ඇති ජවිපෙ, දැන් ප්‍රථම වතාවට ආන්ඩු බලයට සම්බන්ධව සිටින අතර පොරොන්දු කඩකිරීම, බඩු මිල ඉහල යාම සහ සුනාමි සහනාධාර ප්‍රමානවත් පරිදි නොලැබීම යන කරුනු හේතු කොටගෙන වැඩෙන මහජන වෛරයට මුහුන දී සිටී. සුනාමි අර්බුදය මධ්‍යයේ සිය ඉල්ලීම් අතහැර දමන ලෙස ජවිපෙ මහජනයාගෙන් කල ඉල්ලීම වඩ වඩා නොතැකීමට ලක්වෙමින් පවතී. එබැවින් ජවිපෙ වාචාලයෝ නැගෙන විරුද්ධත්වය අපසරනය කිරීමේ හා භේද කිරීමේ ප්‍රයත්නයක් ලෙස වර්ගෝත්තමවාදී මනෝගතීන් ඇවිස්සීමේ යෙදී සිටිති.

පසුගිය සතියේ දී ජවිපෙ පාර්ලිමේන්තු මන්ත්‍රී ජයන්ත විජේසේකර, නැගෙනහිර පලාතේ ත්‍රිකුනාමල නගරයේ පිහිටි විශාල විවෘත ක්‍රීඩා පිටියක් වන මැක්කෙයිසර් ක්‍රීඩාංගනය තුල සුනාමියෙන් විපතට පත් සිංහල ජනයා සඳහා නිවාස ව්‍යාපෘතියක් ඇරඹීමේ ප්‍රකෝපකාරි ප්‍රයත්නයක යෙදුනි. එහි දී විජේසේකර, වෙනත් ස්ථානයක නිවාස තනන ලෙස පාර්ලිමේන්තු තේරීම් කමිටුවක් ගෙන තිබූ තීන්දුව මෙන් ම සිංහල ජනාවාසවල ආක්‍රමනය කෙරෙහි දෙමල ජනයා දක්වන සංවේදිතාව ද හිතාමතාම නොතකා හැරියේ ය. ප්‍රදේශයේ දෙමල ජනයා විරෝධතා දක්වමින් මාර්ග බාධක ඉදිකිරීමෙන් පසුව, පොලීසිය හා මිලිටරිය අවසානයේ සිය ප්‍රයත්නය අතහැර දැමීමට ජවිපෙට බල කලේ ය.

එල්ටීටීඊයත් කරුනා නමින් ප්‍රසිද්ධ වී. මුරලිදරන්ගේ නායකත්වයෙන් යුත් එයින් බිඳුනු කන්ඩායමකුත් සම්බන්ධිත ඝාතන මාලාවකට පසුව නැගෙනහිර පලාතේ පවත්නා ආන්තික ආතති සහගත තත්වය ජවිපෙ වැඩකටයුතු මගින් උත්සන්න කෙරෙයි. පෙබරවාරි 7 දා එල්ටීටීඊයේ නැගෙනහිර ප්‍රධාන දේශපාලන නායක ඊ. කෞෂල්‍යන් ඝාතනය කිරීමෙන් අනතුරුව පෙබරවාරි 28 දා එල්ටීටීඊයේ කාන්තා අංශයේ නැගෙනහිර පලාතේ නායිකා කුවේනි ප්‍රහාරයකට ලක් විය. එහි දී ඇය ද තවත් එල්ටීටීඊ සාමාජිකයන් දෙදෙනෙක් ද බරපතල ලෙස තුවාල ලැබී ය.

මෙම ප්‍රහාර පිටුපස ශ්‍රී ලංකා සන්නද්ධ හමුදා සිටින්නේ යයි එල්ටීටීඊය චෝදනා කොට තිබේ. ආරක්ෂක හමුදා තමන් එම ප්‍රහාරවලට කිසිදු අයුරකින් සම්බන්ධ නැති බව ප්‍රකාශ කලත්, ඔවුන්ට කරුනා කන්ඩායම සමග සම්බන්ධතා පැවති බවත් ඔවුන් එම කන්ඩායම පිලිබඳව මිත්‍රශීලී ආකල්පයක් දරන බවත් නොරහසකි. කුවේනිට එල්ල වූ ප්‍රහාරයෙන් අනතුරුව, විශේෂ කාර්ය බලකායේ ප්‍රධානි නිමල් ලෙව්කේ මෙසේ කරුනු සඳහන් කලේ ඒවා අනුමත කරන ආකාරයකිනි: "කරුනා කන්ඩායම ප්‍රදේශයේ දෙමල ප්‍රජාව තුල පුලුල් සහානුමතියක් හා සහයෝගයක් භුක්ති විඳිමින් එල්ටීටීඊයට එරෙහි ශක්තිමත් බලවේගයක් බවට ද . . . සැලකිල්ලට ගත යුතු බලයක් බවට ද පත්ව තිබේ."

එල්ටීටීඊය ද ඒ ආකාරයෙන් ම ප්‍රතිචාර දක්වා ඇත. පෙබරවාරි 22 දා එල්ටීටීඊය එල්ල කල වෙඩි ප්‍රහාරයකින් යාපන අර්ධද්වීපයේ කිලාලි හමුදා කඳවුර අසල දී සොල්දාදුවෙක් ඝාතනයට ලක් වූ අතර තවත් අයෙක් තුවාල ලැබී ය. එම සොල්දාදුවන් තහනම් කලාපයට ඇතුලු වූයේ යයි එල්ටීටීඊය කියා සිටී. පසුගිය දින කිහිපය තුල එල්ටීටීඊය හා කරුනා කන්ඩායම අතර සිදු වූ තුවක්කු හරඹවලින් දස දෙනෙක් මරුමුවට පත් විය. සෙනසුරාදා රාත්‍රියේ නැගෙනහිර හා උතුරු මැද පලාත් අතර මායිම අසල කොනකුලවෙලිහි දී හටගත් ගැටුමක දී සිවිල් වැසියන් හය දෙනෙක් -- මුස්ලිම් වැසියන් සිවු දෙනෙක්, දෙමල ජාතිකයෙක් හා සිංහල ජාතිකයෙක් -- මිය ගියේ ය. එල්ටීටීඊය ඒ සම්බන්ධයෙන් කරුනා කන්ඩායමට චෝදනා කල අතර මිලිටරිය එල්ටීටීඊයට චෝදනා කලේ ය.

මිලිටරිය මෙම ගැටුම් අවුලුවාලීමට ඍජුව ම සම්බන්ධිත ද නැද්ද යන්න පැහැදිලි නැත. එහෙත්, මිලිටරි ධුරාවලියේ කොටස් සුනාමි ව්‍යසනය දකින්නේ එල්ටීටීඊයට එරෙහිව ආක්‍රමනශීලී පිලිවෙතකට යාමට නියම අවස්ථාවක් ලෙස ය යන්න ගැන කිසිදු සැකයක් නැත. මෙම මනෝගතීන් පිලිබිඹු කරමින්, ජවිපෙ සහ සෙසු සිංහල අන්තවාදී සංවිධාන ඇඟවුම් කර ඇත්තේ, එල්ටීටීඊය දුර්වල තත්වයකට පත්ව ඇති හෙයින් ආන්ඩුව අන්තර් වාර පාලනයක් හෝ එල්ටීටීඊයේ වෙනත් ඉල්ලීමක් සම්බන්ධයෙන් හෝ කිසිදු සහනයක් නොදිය යුතු බව යි.

කුමාරතුංග අසීරු ගමනක යෙදී සිටී. එල්ටීටීඊය සමග යලි සාකච්ඡා අරඹන ලෙස ව්‍යාපාරිකයන් හා මහ බලවතුන් වෙතින් එල්ල වන පීඩනයට මුහුන දෙන අතර ම, ජනාධිපතිත් ඇගේ ශ්‍රී ලංකා නිදහස්

පක්ෂයත් ජවිපෙ මෙන් ම සිංහල ස්වෝත්තමවාදයේ ගිලී සිටින අතර එනයින් ජවිපෙ එල්ල කරන විවේචන සම්බන්ධයෙන් සංවේදී ය. එපමනක් නොව, ජවිපෙ මන්ත්‍රීන් 39 දෙනාගේ සහයෝගය නැතිව ගිය හොත් පක්ෂ නවයකින් යුත් හෙලත්තාඩු පාලක සභාගය සිය පාර්ලිමේන්තු බහුතරය අහිමිව බිඳී යා හැකි ය.

කුමාරතුංග පෙබරවාරි 28 දා ජවිපෙ සමග පැවැත්වීමට නියමිතව තිබූ සාකච්ඡාව අවලංගු කල නමුදු වෙනත් ඇමතිවරුන් සමග කතිකාවක් පැවැත්වූ ඇය ජවිපෙ සනසාලීමේ එල්ලය සහිත නිවේදනයක් නිකුත් කලා ය. සාකච්ඡාමය "අවසන් විසඳුමක" සන්දර්භය තුල හැරෙන්ට අන්තර් පාලනයක් පිලිබඳව සාකච්ඡා නොකරන බව එය සඳහන් කලේ ය -- මෙය වනාහි එල්ටීටීඊයේ ඉල්ලීම සඵල ලෙස ප්‍රතික්ෂේප කරන සූත්‍රයකි. තමන් එම නිවේදනය සම්බන්ධයෙන් සෑහීමකට පත් වන බව ජවිපෙ ප්‍රකාශ කල නමුත් සුනාමි සහන සැපයීම සඳහා මොන යම් හෝ "ඒකාබද්ධ යාන්ත්‍රනයක්" පිහිටුවීමට එය තවමත් දැඩි ලෙස විරුද්ධ ය.

යථා වසයෙන් ගත් කල, කිසිවක් විසඳී නැත. සාකච්ඡා යලි ඇරඹීමට නම් එල්ටීටීඊයට යම් සහන ලබා දීමට කුමාරතුංගට සිදු වේ. එහෙත් ඇය එසේ කල හොත්, ජවිපෙ පාලක සභාගයෙන් ඉවත් වීමේත් ආන්ඩුව කඩාවැටීමේත් අවදානමට ඇය මුහුන දෙයි. එමෙන් ම, නැගෙනහිර වර්ගවාදී ගැටුම් ඇවිලීම සහ එහි සිදු වන ඝාතන රට යලි යුද්ධය කරා තල්ලු වීමේ තර්ජනය මතු කරන තියුනු ආතතීන් නිර්මානය කරයි.

*ඩේලි මිරර්* පත්‍රයේ මෑත දී පල වූ කතුවැකියක් පාලක කව තුල පවත්නා කෝපාග්නිය පිලිබිඹු කලේ යඃ "තමන්ගේ දූවෙන ගැටලු තව දුරටත් සංකීර්න හා තියුනු වන අතර වත්මන් ව්‍යාකූල, ගැටුම් හා ආතති සහගත තත්වය තුල දිගටම හිර වී සිටීමට තමන්ට සිදු වනු ඇති බව ඔවුන්ට (මහජනතාවට) වඩ වඩාත් පැහැදිලි වෙමින් පවතී. . . . මේ පැයේ අවශ්‍යතාව වන්නේ . . . සියලු පාර්ශ්වයන් වැඩිහිටියන් ලෙස හැසිරෙමින් යථාර්ථයට මුහුන දීම යි. එසේ නැත හොත් රටේ අනාගතය අඳුරේ ගිලෙනු ඇත."

කෙසේ වෙතත්, මෙම දූවෙන ගැටලු සමග පොර බදන්නේ කෙසේ ද යන්න ගැන දීමට කිසිදු අවවාදයක් *ඩේලි මිරර්* පත්‍රයට තිබුනේ නැත. 1948 නිදහස ලැබුනු දා පටන් වර්ගවාදී සතුරුකම් හිතාමතාම වගාදිගා කොට දශක දෙකක් තිස්සේ ලේවැකි යුද්ධයක් ගෙන ගොස් ඇති, පාලක පන්තිය, සමස්තයක් ලෙස, මඩ වගුරක් නිර්මානය කර ඇති අතර එයින් ගොඩ ඒමේ විසඳුමක් ඔවුන් අත නැත.

© www.wsws.org